මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date. 2019.05.10

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## Human Rights Commission of Sri Lanka

නිහාල් රණසිංහ මහතා,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

ලේකම්තුමනි,

**<u>මුහුණු ආවරණය සම්බන්ධයෙන් නීත්‍යානුකූල තත්වය පැහැදිලි කිරීම</u>**

බදුල්ල දෙමළ බාලිකා විද්‍යාලයේ ඇතිවූ තත්වය මුල් කරගනිමින් අද දින මා විසින් ඔබ සමග කරන ලද දුරකථන සාකච්ඡාව හා බැඳේ,

02. එහිදී මුහුණු ආවරණ සහිත ඇඳුම් පිළිබඳව මාර්ගෝපදේශයක් නිකුත් කිරීමට එකගතාව පළ කිරීම සම්බන්ධව ඔබ වෙත කෘතඥතාව පල කරන අතර ඒ පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ස්ථාවරය පහත පරිදි පැහැදිලි කරන්නෙමු.

03. හදිසි නීති රෙගුලාසි යටතේ පූර්ණ මුහුණු ආවරණය තහනම් කර ඇති මුත් වෙනත් කිසිදු ආකාරයක ඇඳුමක් තහනම් කර නොමැත. තහනම් කරන ලද හා තහනම් නොකරන ලද මුහුණු ආවරණ පිළිබඳව චිත්‍රණයක් ඇමුණුමක් ලෙස මේ සමග ඉදිරිපත් කර ඇත.

04. රටතුළ උද්ගතව ඇති වත්මන් තත්වය තුළ ආරක්ෂාවට මුල් තැන දියයුතු අතර, එහිදී සිදුකරනු ලබන සෝදිසි කිරීම් වලදී එක් ආකාරයක ඇඳුම් විලාශයක් පමණක් පරීක්ෂාවට ලක් කිරීමෙන් (උදා. මුස්ලිම් කාන්තාවන් විසින් හැඳ සිටින අබායාව) එක් ජන කොට්ඨාශයක් වෙනස් කමකට භාජනය වීම තුලින් ජනතාව අතර නොසන්සුන් තත්වයක් උද්ගත වීමට ඉඩප්‍රස්ථාව සැලසේ. අද දින බදුල්ල දෙමළ මධ්‍ය මහා විද්‍යාලයේද, ඊයේ දින අවිස්සාවේල්ල පුවක්පිටිය මධ්‍ය මහා විද්‍යාලයේද සිදුවූ සිදුවීමට මුල් වූ හේතුව මේ සම්බන්ධයෙන් ජනතාව නිසිලෙස දැනුවත් වී නොතිබීම බව මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. මෙය ඉතා සුලු කරුණක් වූවද මෙවැනි සිදුවීම් විශාල විනාශයන් කරා යාමේ හා රටතුල සාමය කඩවීමේ අවස්ථාවන් නිර්මාණය කිරීමේ මූල බීජය විය හැකි බැවින් ඔබ විසින් පාසැල් වල ආරක්ෂක කටයුතු සම්බන්ධව ඉදිරිපත් කළ චක්‍රලේඛයට වැඩිමනත්ව මෙම ලිපියේ අඩංගු කරුණු පාදක කර ගනිමින් සියලු පාසැල් හා අදාල අංශ වෙත මාර්ගෝපදේශයක් නිකුත් කරනු ඇතැයි බලාපොරොත්තු වෙමු.

සංස්කෘතික සංවේදීතාවයකින් යුතුව පාසැල් වල ආරක්ෂක කටයුතු සාර්ථකව සිදුකිරීම සඳහා එය ඉවහල් වනු ඇතැයි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

(අත්සන)
ආචාර්ය එන්.ඩී. උඩගම,
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
නො 14, ආර්.ඒ. ද මෙල් මාවත,
කොළඹ 04.


ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் – 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04.
සභාපති / தவிசாளர் / Chairperson – 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax – 011 2505541/74
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail – sechrcsl@gmail.com

## Head covering worn by Muslim women







| Banned | Not banned |
|---|---|
| Burqa | Chadors |
| Niqab | Hijabs |
| Fullface | Half |
| Modular | Openface |
| Off-road | Dual-Sport |